# ජාතික අධ්‍යාපන ආයතනය

# අතිරේක භාෂා සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව

# Diploma in Additional Language Improvement

# සිංහල/දෙමළ/ඉංග්‍රීසි පාඨමාලාව

ජාතික අධ්‍යාපන ආයතනයේ ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවනු ලබන අතිරේක භාෂා සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා පාඨමාලාලාභීන් බඳවා ගනු පිණිස අයදුම්පත් කැඳවනු ලැබේ.

**ප්‍රවේශ සුදුසුකම්**

- අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම.

  **සහ**

- රජයේ පාසලක/ රජයේ අනුමත පෞද්ගලික පාසලක, ගුරුවරයෙකු/ විදුහල්පතිවරයෙකු/ පිරිවෙන් ගුරුවරයෙකු/ පරිවේණාධිපතිවරයෙකු/ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ/ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු/ කොට්ඨාස/ කලාප/ පළාත් අධ්‍යාපන කාර්යාල හා අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු වීම.

**පාඨමාලාවේ ස්වභාවය**

- සිංහල මාධ්‍යය අයදුම්කරුවන් සඳහා දෙමළ භාෂා පාඨමාලාවක් ද දෙමළ මාධ්‍යය අයදුම්කරුවන් සඳහා සිංහල භාෂා පාඨමාලාවක් ද ඊට අමතරව ඉංග්‍රීසි භාෂා පාඨමාලාවක් ද පැවැත්වේ.
- මෙම පාඨමාලාව අවසන් කරන පාඨමාලාලාභීන්ට රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන රාජ්‍ය භාෂා ප්‍රවීණතා විභාගය සඳහා ද ඉදිරිපත් විය හැකි ය.
- සති අන්ත හා පාසල් නිවාඩු කාලවල දී පවත්වනු ලබන අර්ධ කාලීන පාඨමාලාවක් වන අතර පාඨමාලා කාලය අවුරුද්දකි.

**පාඨමාලා ගාස්තු**

අයදුම් කිරීමේ ගාස්තුව රු. 500/= කි. ලියාපදිංචි ගාස්තුව රු. 1,000/= කි. පාඨමාලා ගාස්තුව රු. 30,000/= ක් වන අතර එය වාරික දෙකකින් ගෙවිය හැකි ය. පාඨමාලාවට ලියාපදිංචි වන අවස්ථාවේ දී ලියාපදිංචි ගාස්තුව හා පළමු වාරිකය වන රු. 15,000/= ගෙවිය යුතු ය. මීට අමතරව අවසාන විභාගය සඳහා විභාගය පැවැත්වීමට පෙර අදාළ විභාග ගාස්තුව ද ගෙවිය යුතු ය.

**අයදුම් කිරීම**

ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කරන ලද අයදුම්පතක් සම්පූර්ණ කර ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් අධ්‍යක්ෂ ජනරාල්ගේ ගිණුම් අංක **607628** ට රු. 500/= ක මුදලක් බැර කර ලබාගත් කුවිතාන්සියේ මුල් පිටපත සහ නම හා ලිපිනය ලියූ රු. 15/= ක් වටිනා මුද්දර අලවා ''9 x 4''ප්‍රමාණයේ ලියුම් කවරයක් ද සමඟ **2018 පෙබරවාරි 10** දිනට පෙර **''අධ්‍යක්ෂ, ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම''** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. **(මුදල් ගෙවීමේ දී මුදල් ඇණවුම් හෝ ලංකා බැංකුව හැර වෙනත් බැංකුවකට බැර කරන ලද මුදල් හෝ භාර ගනු නොලැබේ.)**

ඉල්ලුම්පත් බහා එවන ලියුම් කවරයේ ඉහළ කෙළවරේ **''Dip in ALI - 2018''** යනුවෙන් සඳහන් කරන්න.

ආචාර්ය ටී.ඒ.ආර්.ජේ. ගුණසේකර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය